**සජිත් ප්‍රේමදාස, (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
**சஜித் பிரேமதாச, (பா.உ)**
**எதிர்க்கட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்**
**Sajith Premadasa, (M.P.)**
Leader of the Opposition – Parliament of Sri Lanka

2026.02.15

**<u>අධිආරක්ෂිත කලාපවල පවා විකාගෝ ක්‍රමයට සිදුවන මනුෂ්‍ය ඝාතන ගැන ආණ්ඩුව රටට පැහැදිලි කිරීමක් කළ යුතුයි</u>**

බත්තරමුල්ල අකුරේගොඩ ආරක්ෂක මූලස්ථානයට ඉතා ම ආසන්නයේ සිදු කළ වෙඩි තැබීමකින් නීතිඥවරයකු සහ ඔහුගේ බිරිඳ ජීවිතක්ෂයට පත්වීම පිළිබඳ පුවත ඇසීමෙන් මා ඉමහත් කම්පනයකට පත්වීමි. මෙම සිදුවීම අපගේ රට මේ මොහොතේ මුහුණ දී ඇති බරපතළ ව්‍යවසනකාරී තත්ත්වය පිළිබඳ ව යළිත් අපට අනතුරු ඇඟවීමක් සිදු කර තිබේ.

වර්තමාන ආණ්ඩුව බලයට ඒමට ඉදිරිපත් කළ ප්‍රධාන සටන් පාඨයක් වූයේ නීතිය හා සාමය  බිඳවැටීම පිළිබඳව යි. ඒ පිළිබඳ ව ඉගැන්වීමට පවා හැකියාව ඇතැයි වේදිකාවල කළ ප්‍රකාශ අපට මේ මොහොතේ දී යළි යළිත් සිහිපත් වේ. මෙම කුරිරු ඝාතනය රටේ නීතිය හා සාමය බිඳ වැටී ඇති බවට මෙන් ම එය සුරක්ෂිත කිරීමට ආණ්ඩුවට හැකියාවක් නොමැති බව තවදුරටත් පෙන්නුම් කෙරේ.

නීතිය හා සාමය සුරක්ෂිත කිරීමට ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ග යනු හුදෙක් මාධ්‍ය සංදර්ශන පමණක් බව මේ තුළින් ඉතාමත් පැහැදිලි ය. පාතාලය මර්ධනය කරනවා යැයි කිවූ ආණ්ඩුව සිදුවන සෑම ඝාතනයක් ම පාතාලය මත හෝ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මත හෝ සම්බන්ධ කර තම වගකීමෙන් මිදීමට දරනා උත්සාහය අපි තරයේ හෙළා දකිමු. මෙම ඝාතනය තුළ දකින්නේ නීතියේ ආධිපත්‍යයට සහ නීතියේ ක්‍රියාකාරීත්වයට එල්ල වන දරුණු අභියෝගය යි.

රටේ ජන ජීවිතය සුරක්ෂිත කිරීමට නීතිය හා සාමය පවත්වා ගෙන යාමත් යුක්තිගරුක ජන සමාජයක පැවැත්ම සඳහා නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත කිරීමත් ආණ්ඩුවේ අත්නොහළ හැකි වගවීම යි. එබැවින් මෙම කුරිරු ඝාතනය පිළිබඳ ව නොපමාව පරීක්ෂණ පවත්වා වගකිවයුත්තන් නීතියේ රැහැනට හසු කිරීමට ආණ්ඩුව ක්‍රියා කළ යුතු අතර අධිආරක්ෂිත කලාපයක පවා බිඳ වැටී ඇති ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට ආණ්ඩුව නොපමාව පියවර ගත යුතු ය. ආණ්ඩුව හදිසි නීතිය පනවමින් රට පුරා ත්‍රිවිධ හමුදාව පවා නීතිය හා සාමය සුරැකීමට කැඳවා ඇති මොහොතක මෙවැනි සිදුවීම් අධිආරක්ෂිත කලාපයක පවා සිදුවීම පිළිබඳ ව ආණ්ඩුව නොපමාව රටට කරුණු පැහැදිලි කළ යුතු ය.

මෙම ඝාතනයෙන් වියෝවූ නීතිඥවරයාට සහ ඔහුගේ බිරිඳට සමගි ජන බලවේගය සහ සමගි ජන සන්ධානයේ සාතිශය සංවේගය පුද කරමු.

**සජිත් ප්‍රේමදාස,**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක .

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
இலக்கம் 30, சேர் மாக்கஸ் பெர்ணாந்து மாவத்தை, கொழும்பு 07.
No. 30, Sir Marcus Fernando Mawatha, Colombo 07.

දුරකතන / தொலைபேசி / Telephones: 011 2699171, 011 2699204
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2699174
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E – mail: sajith_p@dialogsl.net, oppositionleader.sp@gmail.com